# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2024
## ඉතිහාසය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය:.............................................

| 9 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

2024.08

I කොටස

සැලකිය යුතුයි:

(i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

(ii) අංක 1 සිට 20 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. මෙරටට පැමිණි දෙවන යුරෝපීය ජන කණ්ඩායම වූ ලන්දේසීන්ගේ මව් රට කුමක්ද?
   i) පෘතුගාලය
   ii) ඕලන්දය
   iii) මහා බ්‍රිතාන්‍යය
   iv) ප්‍රංශය

2. ක්‍රි.ව.1602 දී ශ්‍රී ලංකාවට පැමිණි ජොරිස් වැන් - ස්පිල්බර්ජන් නම් ලන්දේසි ජාතිකයා හමු වූ උඩරට පාලකයා කවුද?
   i) පළමුවන විමලධර්මසූරිය රජු
   ii) දෙවන විමලධර්මසූරිය රජු
   iii) සේනාසම්මත වික්‍රමබාහු රජු
   iv) ශ්‍රී විජය රාජසිංහ රජු

3. අපරාධ නඩු විසඳීම ප්‍රධාන කාර්යය වූ ලන්දේසීන් විසින් පිහිටුවන ලද ඉහළම උසාවිය කුමක්ද?
   i) රාද් වැන් ජස්ටිට්
   ii) සිවිල් රාද්
   iii) ලෑන් රාද්
   iv) පිස්කල් උසාවි

4. ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ තුළ ආර්ථික කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමේ අරමුණින් තෝම්බු වර්ග සැකසීම සිදුකරන ලද්දේ කුමන අංශ සඳහා ද?
   i) පවුල්, ඉඩම්, පාසල්
   ii) ඉඩම්, ගම්, පාසල්
   iii) ඇතුන්, කුරුඳු, ඉඩම්
   iv) පන්සල්, පවුල්, පාසල්

5. ක්‍රි.ව.1766 දී ලන්දේසීන් සමග ගිවිසුම්කට එළඹී උඩරට රජතුමා කවුද?
   i) පළමු රාජසිංහ රජු
   ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
   iii) II වන රාජසිංහ රජු
   iv) ශ්‍රී විජය රාජසිංහ රජු

6. ලන්දේසි පාලන සමයේ මෙරට සිදු කළ ආර්ථික වෙනස්කම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
   A – මහබැද්දේ දෙපාර්තමේන්තුව වෙනම කපිතාන්වරයකු යටතට පත් කර කාර්යක්ෂම කිරීම
   B – පවුල්, ඉඩම්, පාසල් වශයෙන් තෝම්බු වර්ග තුනක් පිළියෙල කිරීම
   C – ආගම ප්‍රචාරය සඳහා ඉස්කෝල නම් ආයතන ආරම්භ කිරීම
   D – මිතුරාජවෙල අස්වැද්දීමට කටයුතු කිරීම
   i) DCB
   ii) ABC
   iii) ABD
   iv) ACD

7. බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතුවක් නොවන්නේ,
   i) මෙරට වතු වගාවේ පැවැති සීඝ්‍ර දියුණුව
   ii) ශ්‍රී ලංකාවේ පිහිටීමේ වැදගත්කම
   iii) වෙළඳ කටයුතුවල දී ලංකාවට තිබූ වැදගත්කම
   iv) ත්‍රිකුණාමල වරායේ වැදගත්කම

8. ක්‍රි.ව.1798 වර්ෂයේ දී "ශ්‍රී වික්‍රම රාජසිංහ" නමින් උඩරට රජකමට පත් වූයේ කවුද?
   i) මුත්තුසාමි කුමරු
   ii) කන්නසාමි කුමරු
   iii) කුණ්ඩසාලේ කුමරු
   iv) මහා අස්ථාන කුමරු

9. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල වෙළඳ කටයුතු හා පරිපාලන කටයුතු වෙන් වෙන් නිලධාරීන් යටතේ සිදුවිය යුතු බව නිර්දේශ කරනු ලැබුවේ පහත කුමන සිදුවීමෙන් පසුව ද?
   i) ක්‍රි.ව.1796 වෙළඳ සමාගමේ පාලනය ආරම්භ වීමෙන් පසු
   ii) ක්‍රි.ව.1797 මුහුදුබඩ ප්‍රදේශවල ඇති වූ කැරැල්ලෙන් පසු
   iii) ආණ්ඩුකාරවරයාට වෙළඳ සමාගමේ නිලධාරීන්ගෙන් අවශ්‍ය සහාය නොලැබුණු පසු
   iv) ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනයට පවරාගත් පසු

10. ක්‍රි.ව.1803 දී උඩරට ආක්‍රමණය සඳහා ඉංග්‍රීසි හමුදාවට නායකත්වය ලබා දුන්නේ,
   i) ජෝන් ඩොයිලි
   ii) කර්නල් මියුරන්
   iii) මැක්ඩොවල්
   iv) රොබට් බ්‍රවුන්රිග්

11. ක්‍රි.ව.1848 නිදහස් සටනේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ,
   i) කැප්පෙටිපොළ, මඩුගල්ලේ ආදීන් සටනට නායකත්වය සැපයීම
   ii) බ්‍රිතාන්‍යයන් සටන මර්දනය සඳහා බිම්පාළු ප්‍රතිපත්තිය අනුගමනය කිරීම
   iii) උඩරට රදල ප්‍රධානීන්ගේ නායකත්වයෙන් ආරම්භ වීම
   iv) පොදු ජනතාව අතරින් මතු වූ නායකයන්ගෙන් ආරම්භ වීම

12. මිෂනාරීන් විසින් තම ආගම ප්‍රචාරය කිරීම සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශනයකි.
   i) සරසවි සඳරුස
   ii) පරාභව
   iii) ලංකා නිධානය
   iv) උදයභානු

13. ක්‍රි.ව.1915 දී සිංහල - මුස්ලිම් කෝලාහල අවස්ථාවේ දී බෞද්ධයන්ට සිදු වූ අසාධාරණය වෙනුවෙන් හඬ නැගූ හින්දු නායකයා වූයේ,
   i) ආරුමුග නාවලර් තුමා
   ii) සිද්ධි ලෙබ්බෙ මහතා
   iii) පොන්නම්බලම් අරුණාචලම් මහතා
   iv) පොන්නම්බලම් රාමනාදන් මහතා

14. පංච මහා වාද අතරින් ජාත්‍යන්තර ප්‍රසිද්ධියට පත් වූ වාදය වූයේ,
   i) පානදුරාවාදය
   ii) උදන්විට වාදය
   iii) බද්දේගම වාදය
   iv) ගම්පොළ වාදය

15. පහත සඳහන් පිරිවෙන් අතර ඒවා බිහිකිරීමට මූලිකව කටයුතු කළ භික්ෂූන් වහන්සේලා පිළිවෙලින් සඳහන් කරන නිවැරදි පිළිතුර තෝරන්න.

| පිරිවෙන | මූලික වූ භික්ෂූන් වහන්සේ |
|---|---|
| රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන | පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන | පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමි |
| පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන | පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි |

   i) ABC
   ii) CBA
   iii) CAB
   iv) BAC

16. ක්‍රි.ව.1862 දී මෙරට ප්‍රථම වරට මුද්‍රණාලයක් ආරම්භ කිරීමට මූලිකත්වය ගෙන ක්‍රියා කළ භික්ෂූන් වහන්සේ වූයේ,
   i) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
   ii) බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි
   iii) පූජ්‍ය වලානේ සිද්ධාර්ථ හිමි
   iv) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

17. ඉංග්‍රීසීන් ඉන්දියාවට පැමිණෙන විට ශක්තිමත්ව පැවති මුගල් අධිරාජ්‍යයේ පාලකයා කවුරුන් ද?
   i) බාබුර්
   ii) මහා අක්බාර්
   iii) ජහන්ගීර්
   iv) ෂා ජහන්

18. ඉන්දියානු ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා ලෙස පත් වූයේ කවුරුන්ද?
   i) ඩබ්.සී.බොනර්ජී
   ii) දඩාබායි නඕරොජි
   iii) සුරේන්ද්‍රනාත් බැනර්ජි
   iv) බාල් ගංගාධාර් තිලක්

19. ක්‍රි.ව.1857 සිපොයි කැරැල්ල ඇතිවීම කෙරෙහි බලපෑ ආසන්නතම හේතුව වූයේ,
   i) ඉංග්‍රීසීන් ඉන්දියානු ප්‍රදේශ අත්පත් කර ගැනීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තියයි.
   ii) වෙළඳ සමාගමේ ආර්ථික ප්‍රතිපත්ති නිසා ඉන්දීය දේශීය කර්මාන්ත අභාවයට යාමයි.
   iii) ඉන්දියාව තුළ ක්‍රිස්තියානි ආගම පැතිරවීමට ඉංග්‍රීසීන් ක්‍රියා කිරීමයි.
   iv) ගවතෙල් හා ඌරුතෙල් මිශ්‍ර කරන ලද පතොරම් සහිත රයිෆල් වර්ගය භාවිතා කිරීමට ඉංග්‍රීසීන් විසින් සිපොයි භටයන්ට බල කිරීමයි.

20. ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයේ දී මුස්ලිම් ජනතාව වෙනුවෙන් "පකිස්ථානය" ලෙස වෙන ම රටක් පිහිටුවා ගැනීමට නායකත්වය දුන් පුද්ගලයා කවුද?
   i) රාම් මෝහන් රෝයි
   ii) ලාල් ලජ්පත් රායි
   iii) මොහොමඩ් අලි ජින්නා
   iv) මවුලානා අබුකලාම් අසාද්

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1.

i)




i. A අක්ෂරයෙන් දක්වා ඇති පැරණි වරාය කුමක්ද? (ල.01)

ii. B අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ල.01)

iii. C අක්ෂරයෙන් දැක්වෙන පැරණි රාජධානිය කුමක්ද? (ල.01)

iv. D අක්ෂරයෙන් පෙන්නුම් කරන ප්‍රදේශය කුමක්ද? (ල.01)

ii)



A

i. A රූප සටහනේ දැක්වෙන රජු කවුද? (ල.02)

ii. රූප සටහනේ දැක්වෙන පරිදි රජු මුණගැසීමට පැමිණි විදේශීය දූතයා කවුද? (ල.02)

iii. මෙම සිදුවීම කුමන රාජධානි සමයකට අයත් වේ ද? (ල.02)

iii)



B

i. B රූප සටහනේ දැක්වෙන්නේ කුමක්ද? (ල.02)

ii. එය පිහිටා ඇත්තේ කොහේද? (ල.02)

iii. එය ඉදිකරන ලද රජු කවුද? (ල.02)

2.

i) පහත සඳහන් කරුණු හා සම්බන්ධ නිවැරදි පිළිතුරු ඉදිරියෙන් ලියන්න. (ල.02)

a) ලන්දේසීන්ගේ මව්රට -

b) ලන්දේසීන්ගේ පෙරදිග මධ්‍යස්ථානය -

ii) ක්‍රි.ව.1638 ගිවිසුමේ අඩංගු කරුණු දෙකක් දක්වන්න. (ල.04)

iii) අමතර ආදායම් ලබා ගැනීම සඳහා ලන්දේසීන් විසින් මෙරට සිදු කළ කටයුතු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.05)

3.

i) පාලනය කිරීමේ පහසුව සඳහා ලන්දේසීන් විසින් මෙරට ප්‍රදේශ බෙදා තිබූ කොමාන්ඩරි 2 ක් සඳහන් කරන්න. (ල.02)

ii) ලන්දේසීන් විසින් නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙරට පිහිටුවන ලද අධිකරණ පද්ධතියට අයත් උසාවි වර්ග 4 ක් නම් කරන්න. (ල.04)

iii) ලන්දේසි පාලනය නිසා මෙරට සමාජ හා සංස්කෘතික ක්ෂේත්‍රයෙහි ඇති වූ බලපෑම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.05)

4.

i) බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමු වීමට බලපෑ හේතු 2 ක් සඳහන් කරන්න. (ල.02)

ii) ක්‍රි.ව.1797 දී වෙරළබඩ ප්‍රදේශයේ ඇති වූ ඉංග්‍රීසි විරෝධී කැරැල්ල ඇතිවීමට බලපෑ හේතු 2 ක් සඳහන් කරන්න. (ල.04)

iii) ක්‍රි.ව.1803 දී උඩරටට එල්ල කළ ඉංග්‍රීසි ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න. (ල.05)

5.

i) වතු වගාව යටතේ බ්‍රිතාන්‍යයන් මෙරටට හඳුන්වා දුන් බෝග වර්ග 2 ක් සඳහන් කරන්න. (ල.02)

ii) A - ක්‍රි.ව.1818 නිදහස් සටන සඳහා බලපෑ ආසන්නතම හේතුව කුමක්ද? (ල.02)

B - එම සටනෙහි නායකයන් දෙදෙනකු සඳහන් කරන්න. (ල.02)

iii) ක්‍රි.ව.1848 දෙවන නිදහස් අරගලය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

6.

i) මෙරට ධර්මදූත කටයුතුවල නිරත වූ මිෂනාරි සංවිධාන 2 ක් නම් කරන්න. (ල.02)

ii) A - මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ල.02)

B - මෙරට මුද්‍රණාල ආරම්භ කිරීමත් සමඟ බෞද්ධයන් විසින් එළිදක්වන ලද බෞද්ධ ප්‍රකාශන 2 ක් සඳහන් කරන්න. (ල.02)

iii) අනගාරික ධර්මපාල තුමා විසින් මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාරය යටතේ ඉටු කළ සේවාව ප්‍රධාන කරුණු 2 ක් යටතේ පැහැදිලි කරන්න. (ල.05)

7.

i) සිපොයි කැරැල්ල ඇතිවීමට බලපෑ ආසන්නතම හේතුව කුමක්ද? (ල.02)

ii) A - ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනෙන නායකයන් දෙදෙනෙකු සඳහන් කරන්න. (ල.02)

B - ඉන්දියානු ජාතික සංගමය තුළ සිටි මතවාදී කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ල.02)

iii) ඉන්දියාවට නිදහස ලබා ගැනීමේදී මහාත්මා ගාන්ධිතුමාගේ කටයුතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)